# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/8 - 2020 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2020.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

2019.12.10 දිනැති 2153/12 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වෙත පවරා දෙන ලද විෂයයන්, කාර්යයන් සහ දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන අතරින් පහත සඳහන් විෂයයන්, කාර්යයන් සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය එස්. බී. දිසානායක මැතිතුමා වෙත මෙම නිවේදනයේ දිනයේ සිට පවරා දෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. චන්ද්‍රසේන,<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 ජනවාරි මස 20 වැනි දින,<br>බත්තරමුල්ල,<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදාදීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත (1931 අංක 20)
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1)

02 - 28

1A - G 31837 — 370 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*